# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2100/25 - 2018 දෙසැම්බර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2018.12.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

සාධාතුක කරඬුව සහිත ශ්‍රී සුමන සමන් දේව ප්‍රතිමාවහන්සේ ශ්‍රී පාදස්ථානය දක්වා වැඩම කරවීමේ
පෙරහැර 2018- 2019

ලොව්තුරා බුද්ධත්වයෙන් වසර 8 කට පසු සබරගමුවේ පාලකව සිටි සුමන දෙවි මහ රජුගේ ඇරයුමෙන් සමන්තකූඨ පර්වත මස්ථකයේ ශ්‍රී පාද ලාංඡනය පිහිටුවා ශ්‍රී ලංකාව පාරිශුද්ධත්වයට පත්කර වදළ සේක. එතැන් සිට සමන්තකූඨ පර්වතය ලෝක පූජිත වූහ. එවක් පටන් රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් පුද පෙරහැර පවත්වති.

සබරගමු පළාතේ, රත්නපුර දිශාවේ නවදුන් කෝරලයේ පැල්මඩුල්ල කුට්ටපිටිය විහාර ගමේ පිහිටි ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරයේ අවාරයේ දී සුමන සමන් දේව ප්‍රතිමාවහන්සේ තැන්පත් කර පුදපූජා පවත්වන දේව මන්දිරය පිහිටා ඇත.

1. 2018 වසරේ උඳුවප් මස පසළොස්වක පොහොය දිනට පෙර දින සධාතුක කරඬුන්වහන්සේ සහිත සමන් දේව ප්‍රතිමා වහන්සේ ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට සමන්තකූඨ පර්වත මස්ථකයට වැඩම කරවීමේ පෙරහැර මංගල්‍යය පහත සඳහන් පරිදි සුභ හෝරාවන්ගෙන් ආරම්භ කෙරේ.

   * 2018.12.20 දින ප. ව. 6.19 සිට 2018.12.21 පෙ. ව. 4.30 දක්වා දේව ප්‍රතිමා වහන්සේ නිරාවරණය කර බැතිමතුන්ගේ පුදපූජා පැවැත්වීම.

   * 2018.12.21 දින ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහා විහාරස්ථානයේ සිට අළුයම පෙරහැර ආරම්භ කිරීම.

1. අළුයම 5.20ට ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට කුරුවිට, ඇහැළියගොඩ, අවිස්සාවේල්ල, දෙහිඕවිට, කරවනැල්ල, යටියන්තොට, අඹගමුව, හැටන්, මස්කෙළිය හරහා හැටන් මාර්ගයේ නල්ලතන්නියේ පිහිටි නිල ආරාමය දක්වා රිය පෙරහැර පැවැත්වීම.

2. අළුයම 6.19ට ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට පැල්මඩුලු නගරය, රිල්හේන, ගනේගම, මිදිගහමුල්ල, පාතකඩ, බෝගොඩඅරඹ, සන්නස්ගම, දිප්පිටිගල, ලෙල්ලොපිටිය, වැලිමළුව, පතුල්පාන, පැල්වාඩිය, තිරිවානකැටිය, බටුගෙදර, වරකාතොට, කුඩුගල්වත්ත, නගර සභාව, ඔරලෝසු කණුව, පුළුගුපිටිය, බණ්ඩාරනායක මාවත, මොරගහයට, ගල්කඩුව, සබරගමු මහ සමන් දේවාලයට ගොස් ආපසු මොරගහයට, ගල්කඩුව, ජුලියන්ගස් ළඟ වෙරළුපෙ හන්දිය නව

1A -   G 29056 — 17 (2018/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නගරය අනඳමෙත් නාහිමි විහාරය අසලින් හන්දිය දක්වා සීවලි විද්‍යාලය අසලින් කාර්මික විදුහල ෆාම් ගාඩ්න් හන්දිය නැවත නව නගර මාවත ඔස්සේ මොරගහයට මන්සන්ධියෙන් බස්නැවතුම්පොළ පාරෙන් කුඩුගලවත්තට ශ්‍රී පලාබත්ගල මාවත, ගොඩිගමුව හරහා මහවලවත්ත, මල්වල පාර ඔස්සේ ශ්‍රී පලාබත්ගල රජමහා විහාරස්ථානය දක්වා රිය පෙරහැර පැවැත්වීම.

3. අළුයම 7.20ට ගල්පොත්තාවෙල ශ්‍රී පාද රජමහ විහාරස්ථානයේ සිට පැල්මඩුල්ල නගරය, බත්ගම්ගොඩ, මීගහගොඩ, කාමරංගාපිටිය, රඹුක, මොරතොට, හුණුවල, දෙල්ගස්ගාව, ඕපනායක, උඩවෙල, ඇල්ලෙපොල, බලංගොඩ, තුඹගොඩ, ඕලුගංතොට, ඇල්ලෙඅරාව හන්දියෙන්, පින්නවල හරහා බොල්තුඹේ සමන් දේවාලයට ගොස් නැවත බගවන්තලාව පාරෙන් මස්කෙළිය හරහා මාර්ගයෙන් නල්ලතන්නියේ පිහිටි නිල ආරාමය දක්වා රිය පෙරහැර පැවැත්වීම.

අනතුරුව රජ මාවත ඔස්සේත්, හැටන් මාර්ගය ඔස්සේත්, ශ්‍රී පාද මළුව දක්වා සධාතුක කරඬුව සහිත සමන්දේව ප්‍රතිමා වහන්සේ දෝලාවෙන් සමන්තකූඨ පර්වතය දක්වා වැඩම වීමෙන් පෙරහැර මංගල්‍යය නිම කිරීමට නියමිතය.

* ශ්‍රී පාදස්ථානාධිපති නාහිමි නම්කරන රථ සඳහා පෙරහැරේ ප්‍රමුඛතාවය දිය යුතු අතර, පෙළගැස්මට බාධා නොවන ලෙස, පෙරහැරට සම්බන්ධ වන සෙසු රථ එයට පසුපසින් ගමන් කළ යුතු ය.

2. විහාරභූමිය තුළ වෙළඳාම් කිරීම තහනම් කරමි. ප්‍රධාන මාර්ගය හා ප්‍රධාන මාර්ගයේ සිට ශ්‍රී පාද විහාරය දක්වා අතුරු මාර්ගයේ වෙළඳාම් කිරීම හා දන්සැල් පැවැත්වීම, බැතිමතුන්ට හා පෙරහැරට බාධාවක් නොවන ලෙස කළ යුතු ය.

3. පැල්මඩුල්ල නගරයේ සිට ශ්‍රී පාද විහාරභූමිය තෙක් සම්මාදම් එකතු කිරීම, ආධාර එකතු කිරීම තහනම් කරමි.

4. ප්‍රධාන මාර්ගයේ සිට ශ්‍රී පාද විහාරභූමිය දක්වා මාර්ගයේ පෙරහැරට හා බැතිමතුන්ට අවහිර වන ලෙස පුද්ගලික රථවාහන නවතා තැබීම තහනම් කරමි.

5. විහාරභූමිය හා අවට මාර්ගයේ වීදි ලාම්පු හා අමතර ලාම්පු සවිකිරීම ලංකා විදුලිබල මණ්ඩලයට හා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට පවරමි.

6. පෙරහැර මංගල්‍යයට පෙර හා පසු සෞඛ්‍ය කටයුතු සනීපාරක්ෂක කටයුතු හා අපද්‍රව්‍ය ඉවත් කිරීම පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට පවරමි.

7. බැතිමතුන්ට අවශ්‍ය පානීය ජලය අමතර ජලටැංකි යොදා පහසුකම් සැපයීම ජල සම්පාදන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයට පවරමි.

8. සියලු ආරක්ෂක කටයුතු පෙරහැරට හා බැතිමතුන්ට අවහිර නොවන ලෙස මාර්ගයේ රථවාහන හැසිරවීම ආරක්ෂක අංශ හා පොලීසිය වෙත පවරමි.

9. ශ්‍රී පාදස්ථානයේ මාස 6ක් වන්දනාමාන හා පුදපූජා පවත්වා ඉදිරියට එළඹෙන වෙසක් පෙහොය දිනට පසු ගල්පොත්තාවෙල රජමහා විහාරස්ථානයේ මහා දේව මන්දිරයේ තැන්පත් කර පුදපූජා පවත්වනු ලබයි. එදින තෙක් උක්ත කරුණු 08ට අදළ නියෝග වලංගු වේ.

බී. එස්. ජී. රුවන්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

12 - 586

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.